# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் தளம் / Website: www.treasury.gov.l


මගේ අංකය / எனது இல. / My No.: බඩ්/සීබීපී/1/1/2011
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2010.12.28

ජාතික අයවැය චක්‍රලේඛ අංක 151

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

## 2011 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම

2010 දෙසැම්බර් මස 10 වන දින පාර්ලිමේන්තුවේ අනුමත කරනු ලැබූ 2010 අංක 20 දරණ විසර්ජන පනතට අනුව, 2011 මුදල් වර්ෂය සඳහා අනුමත අයවැය ඇස්තමේන්තුවල ඇතුලත් ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා අදාල අධිකාරී බලපත්‍ර ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.ඒ අනුව ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලිමත ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් විසින් පහත සඳහන් පරිදි අධිකාරිය සටහන් කළ යුතුය.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා 2011 අංක 1 දරණ සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය
(ආ) විශේෂ නීති සේවා කටයුතු සඳහා 2011 අංක 1 දරණ විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍රය
(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා 2011 අංක 1 දරණ අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය

02. 2011 වර්ෂයේ වියදම් සඳහා අග්‍රිම සීමා නියම කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2010.12.08 දිනැතිව නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 8/2010 මගින් දක්වා ඇති පරිදි 2010.12.31 දින හෝ ඊට පෙර එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

03. පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2010 අංක 20 දරණ විසර්ජන පනතේ තෙවන උප ලේඛණයේ ඇතුලත් කර ඇති අත්තිකාරම් ගිණුම් පිළිබඳ සීමා තරයේ පිළිපැදිය යුතුය. ගබඩා අත්තිකාරම් ගිණුම්වල කටයුතු මෙහෙයවීමේදී මනා තොග පාලනය, අනවශ්‍ය ලෙස තොග රැස්කිරීම වැලැක්වීමට සහ අවශ්‍යතාවයන්ට අනුරූපවන පරිදි භාණ්ඩ ඇණවුම් කිරීම් පිළිබඳවද දැඩි අවධානය යොමු කළ යුතු අතර එක් එක් ආයතනය වෙත ලබාදී ඇති වගකීම් සීමාවන් වැඩිකිරීමට හැකියාවක් නොමැති බවද අවධාරණය කරමි .

04. 2010 අංක 20 දරණ විසර්ජන පනතේ 6 වගන්තියේ විධිවිධාන අනුව,2010 දෙසැම්බර් මස 10 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ 2011 මුද්‍රිත ඇස්තමේන්තුවල අයවැය සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ නිශ්චිතව සඳහන් කළ කාර්යයන් සඳහා හැර අනෙකුත් කාර්යයන් සඳහා අතිරේක ප්‍රතිපාදන සලසාදීමට භාණ්ඩාගාරයට හැකියාවක් නොමැති බැවින් එක් එක් වැය ශීර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමා තුළ වියදම් කළමනාකරණය කර ගත යුතුය.

05. 2011 අයවැය යෝජනාවන් මගින් අපේක්ෂිත පරිදි මැදිකාලීන වියදම් රාමුව තුල තිරසාර අන්දමින් සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඉහල කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් යුතුව මූල්‍ය සම්පත් කළමනාකරණය කර ගැනීමට ඔබගේ උපරිම දායකත්වය සහ කැපවීම ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති